රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: **(94) 011- 2694560** Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/04
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.01.05.

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරන ලද/ අන්තර්ග්‍රහණය කිරීමට නියමිත නිලධරයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් සහන ලබාදීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2021.12.09 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2252 හා 2021.10.29 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව 2023.03.04 දින පවත්වන ලද සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටි නිලධාරීන්ගේ ප්‍රතිඵල ලේඛනය මෙම අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පළ කර ඇත.

03. 2023.03.04 දින පවත්වන ලද සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නිලධාරීන් සඳහා මගේ සමාංක හා 2021.12.09 දිනැති ලිපියේ විධිවිධාන අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සහන සැලසිය යුතු අතර, මේ වන තෙක් සංවර්ධන නිලධාරි සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වාර 3ක් පමණක් (2018.04.21, 2020.01.19 හා 2023.03.04 යන දිනයන්හි) පවත්වා ඇති බැවින් හා එම පරීක්ෂණයන්හි ප්‍රතිඵල නිකුත් කර ඇති බැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2016 හි 4 ඡේදයේ අනු අංක 4 අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් හා පහත අවශ්‍යතා සම්පූර්ණ කර ඇති සංවර්ධන නිලධාරි සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන්ට බාධාවකින් තොරව වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

i) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ප්‍රතිඵල නියමිත ආකෘතිය මඟින් අදාළ නිලධාරියා වෙත දන්වා තිබීම
ii) නිලධාරියාට සහභාගී විය හැකි වන පරිදි පූර්ව සේවයේ/ තනතුරේ හා සංවර්ධන නිලධාරී සේවයේ දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවස්ථා 6ක් තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.
iii) නිලධාරියාගේ කාර්ය සාධන වාර්තා නිසි පරිදි සම්පූර්ණ කර ඇගයුම්කරු හා ප්‍රමාණකරු නිසි පරිදි ප්‍රමානණය කර තිබීම.
iv) වාර්ෂික වැටුප් වර්ධකයක් ගෙවීමට අදාළ අනෙකුත් සියලුම අවශ්‍යතා නියමිත පරිදි සපුරා තිබීම

එස්.ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්